සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2014
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.**

(01) හිත් හෝදිසියෙන් ඒ මාර්ගයේ නොගියොත් නිරතුරු ව ම පැටවුන් සමග එන වැලහින්නගේ කරදරවලට මුහුණ දීමට සිදු වනු ඇත.
(1) කල්පනාවෙන් (2) උත්සාහයෙන් (3) නරඹමින් (4) බියෙන්

(02) මේ දිනවල පවතින උණ රෝගයට ගොඩ වෙදකම් නො කළ යුතු බව ලොකු අක්කා කිවා ය.
(1) ගැමියන්ගේ වෙදකම් (2) උපදෙසින් තොර වෙදකම්
(3) පෞද්ගලික වෛද්‍යවරුන්ගේ වෙදකම් (4) දේශීය වෙදකම්

(03) අතීතයේ සිදු වූ බොහෝ දුක් කරදර පිළිබඳ ව ඔහුට නිනව්වක් ඇත්තේ නැත.
(1) බොරු බියක් (2) විස්තරයක් (3) මතකයක් (4) ලිඛිත සාක්ෂ්‍යයක්

- **අංක 04 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස් තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) නායකයින්ගේ ............. රටක අර්බුද ඇති වීමට ප්‍රබල හේතුවක් වේතැ'යි විශ්වාස කෙරේ.
(1) සාමකාමී බව (2) උත්තේජනය
(3) අත්තනෝමතික බව (4) විමසිලිමත් බව

(05) උසස් පෙළ සම්මන්ත්‍රණයට ............. ශිෂ්‍ය ක්‍රියාකාරකම් අත්පොත එළි දැක්විණි.
(1) ශීඝ්‍රගාමී ව (2) එදිරි ව (3) සමගාමී ව (4) අනුගාමී ව

(06) අනාගත පරපුර වෙත නව දැනුම ............. කිරීම එදා මෙන් ම අද ද සිදු වේ.
(1) සංශ්ලේෂණය (2) සංක්ෂේපණය (3) සම්භාවිතාව (4) සම්ප්‍රේෂණය

(07) අකාරාදි පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) පොළොන්නරුව, පොල්ගොල්ල, පෝරුව දණ්ඩ, පෝද්දල
(2) මහනුවර, මාතර, මොණරාගල, මූණමල්දෙණිය
(3) කොට්ටාව. කොරලවැල්ල, කොළඹ, කෝට්ටේ
(4) ගලපටමඩ, ගාල්ල, හිලීමලේ, ගැටඹයගල

(08) කෙටි ඇදපිල්ල, පාපිල්ල, ඇලපිල්ල, රකාරාංශය යන පිලි පිළිවෙළින් නිවැරදි ව යෙදී ඇති වචන පේළිය තෝරන්න.
(1) කුමරු, කැටය, කාලය, අම්මා (2) රැය, රුව, මාල, පත්‍ර
(3) නැහැය, පුටුව, ක්‍රමය, තාරාවා (4) කැලය, සාමා, සිසිල, අවශ්‍ය

(09) සමානාර්ථවත් පද සහිත යුගල පද දෙකකින් සමන්විත වරණය තෝරන්න.

(1) එතෙක්-මෙතෙක්, ඔබ-මොබ, නගින-බහින, කුදු-මහත්
(2) ඉඟි-බිඟි, බාර-දූර, ගසා-බසා, ළමයි-බමයි
(3) අඩු-ලුහුඩු, තුටු-පහටු, විළි-ලැජ්ජා, සරු-සාර
(4) අණ-විත, කුලී-මලී, සට-කපට, ගුරු-ගෝල

- සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති වරණය තෝරන්න.

(10)
(1) අනුගමනය, ඍනත්වය, අභිෂේකය, වාර්තාකරණය
(2) ශ්‍රවනාධාර, ලිපිගොණුව, ලෞකික, පුස්තකාලය
(3) කුනු කසළ, පෙලගීම, මුලුතැන්ගෙය, සමතුලනය
(4) සෙවණැලි, ලුහුමාළු, දුෂ්කර, ත්‍යාග ප්‍රදානය

'බත්ගස වවමු' මෙහි තද කළු අකුරෙන් මුද්‍රිත පදයෙහි ඇතුළත් අකුරු අයත් වන අක්ෂර වර්ග නිවැරදි ව පිළිවෙළින් දක්වා ඇති පේළිය තෝරන්න.

(11)
(1) ඕෂ්ඨජ, දන්තජ, තාලුජ, දන්තජ
(2) තාලුජ, මූර්ධජ, දන්තජ, ඕෂ්ඨජ
(3) දන්තජ, කණ්ඨජ, මූර්ධජ, තාලුජ
(4) ඕෂ්ඨජ, දන්තජ, කණ්ඨජ, දන්තජ

- අංක 12 හා 13 වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

(12) .................. කලින් කලට වෙනස් වූහ'යි ව්‍යාකරණඥයෝ ප්‍රකාශ කරති.

(1) භාෂාරීතීන් (2) භාෂා රීතිහු (3) භාෂා රීතිහු විසින් (4) භාෂා රීතියක්

(13) 'ඔබ හා සමාන නුවණ ඇති කෙනෙකු පහළ වී ..................'

(1) නැත්තෙහු. (2) නැත්තෙමු. (3) නැත්තෝ ය. (4) නැත.

(14) නිවැරදි ව විසන්ධි කර නැති පද සහිත පේළිය තෝරන්න.

(1) මෙ+අත, දුර්+ආචාර, වල්+ඌරා, දිග+ඇසියන්
(2) භාෂා+අනුරාගය, පුළුල්+උකළ, කවි+ඉන්ද්‍ර, වන්+කම්
(3) සකසුරු+අම්, ශ්‍රවණ+එන්ද්‍රිය, දෑ+අගසවු, සහ+ඕදර
(4) නි+අතුරු, විවිධ+අර්ථ, වන+ඖෂධ, ක්‍රිස්තු+උත්පත්ති

(15) ඉරි ඇඳි පදවල ක්‍රියාවර්ගය පිළිවෙළින් නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

- "<u>ගනු</u> අවසරය එනිරිඳු සිරි පතුල් වැඳ"
- "නස්නට සටන් බිම <u>වදිතොත්</u> කෙදින හරි"
- බෙර දවුල් හඬ <u>අසා</u> ඇඟෙහි මස වියරු වෙයි
- විලසින් දිය <u>කෙළ කෙළ</u> යෙත් නොමැළී

(1) ප්‍රයෝජ්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා
(2) විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(3) විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(4) විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(16) මුලින් දී ඇති පදයට සමානාර්ථ පද දෙකක් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සිරිකත-ලක්ෂ්මී, සිරිදුව, ශ්‍රී කාන්තාව, පියුමඹා
(2) අනංග-කුසුම්සරා, මින්දද, සමර, මලවි
(3) ශිෂ්‍ය-අතවැසි, ඇදුරු , රුපු, ප්‍රේක්ෂක
(4) නිපුණ-ප්‍රභාවත, කල්‍යාණ, ප්‍රවීණ

(17) මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ පදයක් ඇතුළත් වී ඇති පද පේළිය තෝරන්න.

(1) පර්යන්තය-අග, අන්තය, කෙළවර, කොන
(2) විශාරද-නැණවත්, පණ්ඩිත, වියත්, බුද්ධිමත්
(3) හපන්කම-කයිවාරුව, පම්පෝරිය, පුරසාරම, පුච්චම
(4) සමූහ-සකල, සර්ව, සමස්ත, කේවල

(18) මුලින් දී ඇති පදයට බහු අර්ථ දෙන පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) පර-අන්‍ය, නීච, පරගස, මැලවුණු
(2) සල්-සල්ගස,ශෛල, ශාලා, සතිය
(3) පිට-තුළ, පිටුව, පැත්ත, ආගන්තුක
(4) රා-රාගය, සුරාව, රැය, සංගීතයේ රාග

(19) ප්‍රත්‍යයාර්ථ නාම පදයක් යෙදී නැති වාක්‍යය තෝරන්න.

(1) "සුරතල් දියණිය මොළකැටි වදනින් මා සනසන්නිය අහර පිසින්නිය"
(2) "මිනිසා සුවඳයි මල සේ නුවණින් එළියයි හිරු සේ"
(3) "සිනා නගන්නී ලැසි ලැසි ගමනින් එන්නී"
(4) "හෙළ ජාත්ක අභිමානේ වැඩූ විරුවන් සේ පොරණේ"

(20) මුලින් දී ඇති සමාස වර්ගයට අයත් පද පමණක් ඇතුළත් වරණය නම් කරන්න.

(1) 'ද' කාරාර්ථ සමාසය - ආගම දහම, සුරනර, ගංහෝ, නළුනිළි
(2) අව්‍යය සමාසය - අපමණ, පවර, කුමන්ත්‍රණ, ස්නේහ
(3) විශේෂණ සමාසය - රහල්තෙර, ගල්හිත, ගම්පළා, ගවමස්
(4) අන්‍යාර්ථ සමාසය - මලවි, සහසැස්, බටහිර, මුහුදු සුළං

* අංක 21 සිට 22 තෙක් වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටස කවර ව්‍යාකරණ වර්ගයකට අයත් දැ'යි තෝරන්න.

(21) ඒ පිරිහුණු විශාල පවුලේ කම්මැළි රදළ තරුණයන් ගැන වංගුංව සිහි වුණේ ය.
(1) නිපාත (2) උපසර්ග (3) තද්ධිත (4) සර්ව නාම

(22) 'පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වත් අවට'
(1) නිපාත (2) සමාස (3) ක්‍රියා විශේෂණ (4) නාම විශේෂණ

* අංක 23 හා 24 ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටස වෙනුවට යෙදිය හැකි වඩාත් ගැළපෙන තනි පදය තෝරන්න.

(23) බීජ වැපිරෙන භූමි ප්‍රමාණය හොඳින් දන්නා ගොවියා බිත්තර වී කිලෝ පනහක ගෝනියක් මිල දී ගත්තේ ය.
(1) පත්තුව (2) දෙණිය (3) වපසරිය (4) අක්කරය

(24) කඩිසර බවින් තොර ව කටයුතු කිරීමේ ගුණයට තෑග්ගක් දෙන්නේ නම් එය අනිවාර්යයෙන් ම හිමි විය යුත්තේ මගේ අක්කාට ය.
(1) උදාසීන (2) උද්‍යෝගී (3) ත්‍යාගශීලී (4) නිරර්ථක

* අංක 25-26 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

(25) "වැරදි දක දක වැරදිවලට අනුබල දීම"
(1) නරියා මිදි තිත්තයි කීවා වගේ
(2) පනින රිළවුන්ට ඉණිමං බැන්දා වගේ
(3) ඇමගිල්ල මාළුවා වගෙයි
(4) කිරි කළයට ගොම දැම්මා වගේ

(26) "නොසිතූ අයුරින් ප්‍රතිඵල ලැබීම"
(1) කළුවා මාරපන් ගියා වගෙයි
(2) ජාඩියට මූඩිය වගෙයි
(3) ගහන හෙණය පැණි වරකා ගහටත් ගහනවලු
(4) විද්දේ පඳුරට වැදුණේ හාවාට

* එක් එක් පේළියේ මුලින් යෙදී ඇති පද දෙක පිළිවෙළින් ගත් කල අර්ථය වැරදි ලෙස දැක්වෙන පදයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(27) (1) යථාර්ථවත්, අලාමක - සැබෑ අරුතින් යුත්, මේරු
(2) සලඹ, මල් මුවරද - පා වළලු, මල් පැණි
(3) දළලා, අත්වරට - වැහි වලාකුළ, පව් බැඳුණු
(4) විත්දත්, කල් බඳ - නාට්‍ය ශාස්ත්‍රය දත් අය, කාලය බැඳගත්

(28) 'නැරඹීමු' යන ක්‍රියා පදයේ ප්‍රථම පුරුෂ වර්තමාන කාල කර්ම කාරක බහු වචන රූපය වන්නේ,
(1) නැරඹුවෙමු (2) නැරඹුවෙහු (3) නැරඹෙති (4) නරඹනු ලැබුණේ ය

(29) පද බෙදා ලිවීම අතින් වඩාත් නිවැරදි වාක්‍යය තෝරන්න.
(1) රාත්‍රී කාලයේ තනිව ම ගමන් බිමන් යාම නුවණට හුරු නැත.
(2) ඇත්තට ම අම්මා කෙනෙකු සතුටු කිරීම තරම් සතුටක් දරුවකුට ඇද්දැයි අදිකාරම් ඔහුගෙන්ම ප්‍රශ්න කෙළේය
(3) ජීවිත කාලයක් පුරා ලැබිය හැකි උසස් ම දැනුම නම් තමා ගැන අවබෝධයක් ලැබීම යි
(4) ප්‍රස්තාව පිරුළුමෙන් ම ආප්තෝපදේශ ද අදහසක් සිතට කාවදින ලෙස ද රසවත් ලෙස ද පුරාණයේ සිටම භාවිත විය

(30) වැරදි අදහස දෙන වරණය තෝරන්න.
(1) පූර්ව ක්‍රියාවක් සමඟ ඇත, නැත යන පද යෙදෙන විට උක්තය අනුක්ත ව තැබේ.
(2) ප්‍රාණවාචී බහු වචන පදයක් සංඛ්‍යාවාචී පදයක් සමඟ උක්ත වූ විට ආඛ්‍යාතය බහු වචන වේ.
(3) ප්‍රාණ වාචී පද දෙකක් 'ද' නිපාතයෙන් සම්බන්ධ වූ කල්හි ආඛ්‍යාතය ඒක වචන වේ.
(4) " චි" නිපාතය සහිත වාක්‍යයක උක්තය අනුක්ත කොට තැබිය යුතු ය.

(31) නිවැරදි ව ගළපා ඇති වාක්‍යය තෝරන්න.
(1) වන සතුන්ගෙන් කුඹුර ආරක්ෂාවට කෙම් ක්‍රම සිදු කරන නිසග බුද්ධිය ගොවියාගේ කියා පායි.
(2) පුරාවිද්‍යාව අනුව පරිණාමය ද අක්ෂරයන්ගේ ඉතා වැදගත් බවට තෝනිගල ලිපියෙන් හෙළි වෙයි.
(3) ළමා කාලයේ දී මිතුරාත් මමත් නොතරම් කම් නො කළෙමු.
(4) කවියාගේ රස නිෂ්පත්තිය පරමාර්ථය වන නිසා ඔහු රසය උදවු කරගෙන වචන නිපදවන්නේ ය.

(32) පෙළපොතින් උපුටා ගත් පහත සඳහන් ප්‍රකාශ අයත් වන පාඩම් පිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?
- "අහෝ ! ඛේදයකි. ඔහු තවම නැත්තේ කිම?"
- "අනෙක් කිසි පුරුෂයකු දකැයි තී සිතාසුණු යේ"
- "අද ගිටන් කුඹුරෙන් වරෙන්!"
- පල ගිහිං හුම්තෙල් කාල දන්වත් ගෙන...."

(1) මග බලමින්, වංකගිරි අරණේ දී, කෙතෙත් සිප්හලට, බෙලෙක්
(2) සතර බීරි කතාව, උදුම්බරා, බෙලෙක්, මහගෙදර රාත්‍රියක්
(3) මගබලමින්, උදුම්බරා, කෙතෙත් සිප්හලට, සතර බීරි කතාව
(4) මගබලමින්, උදුම්බරා, කෙතෙත් සිප්හලට, බෙලෙක්

(33) උපමාවක් ඇතුළත් නොවන කවි පදය තෝරන්න.
(1) "අස්වන ලියන් දක ලිය කිඳුරඟන යුරු"
(2) "රාජ මාලිග ඈ සියල් - නො දේ මේ වන් සැප විපුල්"
(3) "පොඩි තුඩු දොඩම් කටු මෙනි ගී විදිල්ලෙකි"
(4) "බලා සිටු රඟන රඟ මඬලැ කල් බඳ'

- අංක 34 සිට 36 තෙක් ඇති ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

(34) සමස්ත ජනතාවගේ අවධානය යොමු නොවීමත් කීප දෙනෙකුගේ නොසැලකිල්ලටත් වඩා නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව ඩෙංගු රෝගය වර්ධනය වීමෙහි ලා ප්‍රබල සාධකයක් වන බව නොරහසකි.
(1) සියලුදෙනාගේ මෙන් ම නිලධාරීන්ගේ අවධානය ඩෙංගු මර්දනය සඳහා යෙදවිය යුතු ය.
(2) ඩෙංගු රෝගය වර්ධනය කිරීමේ දී අකාර්යක්ෂම නිලධාරීන් වග කිව යුතු බව සියලු ම ජනතාවගේ මතය වී ඇත.
(3) නිලධාරි කාර්යක්ෂමතාව හා සැම දෙනා ම එකා මෙන් මෙම භයානක උවදුර පිටු දැකීමට වෙහෙසිය යුතු බව පිළිගත් සත්‍යයකි.
(4) නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව ඩෙංගු රෝගය වර්ධනයට ප්‍රබල සාධකයක් වන අතර සියලු ජනතා අවධානය යොමු නොවීමත් සුළුතරයන්ගේ නොසැලකිල්ලටත් වඩා එය බලවත් ය.

(35) සිංහල ගීතයේ යථාර්ථවාදී ප්‍රවණතාවෙහි දක්නා ලද විශේෂත්වය නම්, ගීතය මගින් මිනිසුන් අතර වන සබඳතා සියුම් ලෙස නිර්මාණය කොට දක්වීමට ගන්නා ලද වෑයමයි.
(1) සිංහල ගීතයේ විශේෂත්වය මිනිස් සම්බන්ධතා නිර්මාණයේ දී වැදගත් ලෙස යොදා ගත යුතු බව දක්වීමට ඇති හැකියාවයි.
(2) සිංහල ගීතයේ වර්ධනීය ලක්ෂණයක් වන්නේ සබඳතා සියුම් ලෙස නිර්මාණය කොට දක්වීමට ගත් වෑයමයි.
(3) සිංහල ගීතයේ සත්‍ය වශයෙන් ඇති වර්ධනයේ ප්‍රධාන වෙනස ගීතය මගින් මිනිස් සබඳතා ඉතා සියුම්ව ගෙන හැර පෙන්වීමට ගත් වෑයමයි.
(4) සිංහල ගීතයේ වර්ධනයට මිනිස් සබඳතා සියුම් ලෙස විග්‍රහ කිරීමට දැඩි උත්සාහයක් ගත යුතු බවයි.

(36) වැරදි හා ක්ලිෂ්ට ව්‍යවහාරයන් ප්‍රචාරණය නො කළ හැකි වන සේ මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් නොකළොත් බස යළි ගොඩ නැගීමට තවත් කුමාරතුංග කෙනෙකුන් පහළවන තුරු අපට බලා සිටින්නට සිදු වනු ඇත.
(1) බස කෙළෙසීමට නොකළ හැකි වන සේ මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් නොකළොත් බස ගොඩ නැගීමට කුමාරතුංග කෙනෙක් පහළ වන තුරු බලා සිටීමට සිදු වනු ඇත.
(2) කුමාරතුංග පහළ වුවහොත් කෙළෙසෙන බස රැක ගැනීමට හා නිවැරදි මාධ්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට හැකි වනු ඇත.
(3) වැරදි හා ක්ලිෂ්ට ව්‍යවහාරයන් සමග නිවැරදි මාධ්‍ය ප්‍රතිපත්තියක් තුළින් තවත් කුමාරතුංග කෙනෙක් අප බිහි කර ගත යුතු ය.
(4) වැරදි හා ක්ලිෂ්ට ව්‍යවහාරයන් ප්‍රචාරය නොකළ හැකි වන සේ මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීමට කුමාරතුංගයන් දිවා රෑ වෙහෙස වූ බව අප නොදන්නවා නොවේ.

- 37 සිට 39 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව වඩාත් නිවැරදි වාක්‍ය තෝරන්න.

(37) (1) තාත්තා ද, පුතා ද කුඹුරේ වැඩ කරයි.
(2) කටකාරයෙක වූ ඔහු විවාද තරගයෙන් ජය ලැබුවේ ය.
(3) මා සෙල්ලම් කරති' යි සීයා සිතන්නෝ ය.
(4) ගැහැන්යක් දරුවෙක් වඩාගෙන කන්ද නැංගා ය.

(38) (1) දොස්තර කෙනෙක් රෝහල දෙසට ගමන් කළෝ ය.
(2) 'අම්මාවරුනේ'ගීතය රචනා කරනු ලැබුවෝ ධර්මසිරි ගමගේ මහතා ය.
(3) රෝහල පිරිසිදු කරනු ලැබුවෝ ශිෂ්‍යයෝ විසිනි.
(4) හෙතෙම පරිසරය රැකගන්නා අන්දම මුල සිට කීවේ ය.

(39) (1) ඒ දණ්ඩෙන් ගඟට වැටුණු කුඩා දරුවා බේරා ගත් සිසුවා ප්‍රශංසාවට ලක් වූහ.
(2) මහ බෝසතාණෝ පන්සියයක් ගැලින් වෙළෙඳාම් කොට ඇවිදිනාහු ය.
(3) පන්තියේ ශිෂ්‍යයෝ සියලු දෙනා දක්ෂ දරුවන් බව මවුපියෝ නොදනී.
(4) කුමාරි දක්ෂ ශිෂ්‍යාවක් පමණක් නොව කීකරු දුවක් ද වූවා ය.

(40) "එළිවෙන පැය ගෙය ඇතුළත හොල්මන විලසින් ඇවිදින
මා නැහැපුඩු මුළුතැන්ගෙයි පෙර අහරක සුවඳ සොයන"
මෙහි එළිවෙන පැය හොල්මන විලසින් ඇවිදින්නේ
(1) මා ය. (2) අම්මා ය. (3) තාත්තා ය. (4) නංගී ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) අංක I-X තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට පිළිතුරු නොලියන්නේ නම් එම ප්‍රශ්න අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ක් + ආ → කා අක්ෂරය සෑදීමට එක් වූ පිල්ලම ඇලපිල්ල නම්,

| | අක්ෂරය | පිල්ලම |
|---|---|---|
| (අ) ක් + ඇ | ........................ | ........................ |
| (ආ) ක් + එ | ........................ | ........................ |

(ii) පහත දැක්වෙන වාක්‍යයෙහි අක්ෂර වින්‍යාසය වැරදි ලෙස යෙදී ඇති පද දෙක පමණක් නිවැරදි කර ලියන්න.
"සීඝ්‍රගාමී බස්රථ රියැදුරාගේ ආරක්ෂාකාරී රිය ධාවනය මගීන්ගේ ප්‍රසංශාවට ලක් විය."

(අ) ..............................................................
(ආ) ..............................................................

(iii) පහත සඳහන් පදවල ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන්කර දක්වන්න.

(අ) පුටුව - ..........................................................
(ආ) පිහියක් - ..........................................................

(iv) සිංහල භාෂාවේ සන්ධි ක්‍රම හතරෙන් අක්ෂර හා ආගම යනුවෙන් සන්ධි ක්‍රම දෙකකි. ඉතිරි සන්ධි ක්‍රම දෙක දක්වන්න.

(අ) ..............................................................
(ආ) ..............................................................

(v) අර්ථය වැඩි කරන හා අර්ථය හීන කරන උපසර්ගය බැගින් යොදා පහත දැක්වෙන පද නැවත ලියන්න.

| | අර්ථය වැඩි කරන | අර්ථය හීන කරන |
|---|---|---|
| (අ) බල - | ........................ | ........................ |
| (ආ) මිහිරි - | ........................ | ........................ |

(vi) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
"අතිගරු වැලිවිටියේ සිරි සෝරත නාහිමිගේ කෘති කියැවීමේ දී උන්වහන්සේගේ භාෂා ඥානයේ පටුත්වයත්, ප්‍රඥා පාටවයත් මනාව අවබෝධ වේ."

(අ) පටුත්වයත් ..........................................................
(ආ) ප්‍රඥා පාටවයත් ..........................................................

(vii) 'වන්ත' තද්ධිත ප්‍රත්‍යය යෙදූ වචන දෙකක් සහ 'ඉලි' කෘදන්ත ප්‍රත්‍යය යෙදූ වචන දෙකක් ලියන්න.

(අ) වන්ත ........................................ ........................................

(ආ) ඉලි ........................................ ........................................

(viii) 'කොහොඹ තුර තුළ බැඳී මීය මෙන්' යන පිරුළෙන්, 'නොගැළපෙන තැනක තැබුවත් වටිනා දෙය වෙනස් නොවේ' යන්න අර්ථවත් වේ නම්, 'සුවඳැල් වී පතා අඟුරු වපුරනු වැන්න කියනා' යන ප්‍රස්තාව පිරුළෙන් ධ්වනිත වන අර්ථය කුමක් ද?

....................................................................................................................................

....................................................................................................................................

(ix) පහත දැක්වෙන වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.

(අ) පාඨකයන් විසින් ලේඛකයෝ සම්මානයෙන් පිදෙති.

....................................................................................................................

(ආ) අධ්‍යක්ෂවරුන් විසින් ව්‍යාපෘති සැලසුම් කරන ලදි.

....................................................................................................................

(x) ප්‍රාදේශීය වහරින් "කිරිගෙජ්ජ" යන්නට පොදු වහරේ දී "පොල්ගෙඩිය" යන්න භාවිත වේ නම් පහත සඳහන් පදවල පොදු වහර ලියන්න.

(අ) පැඟිරි කොළ : ........................................................

(ආ) දිය දොස් : ........................................................

(ලකුණු 2×10 = 20)

(02) පහත සඳහන් අ, ආ, ඉ, ඊ යන ව්‍යූහ අතරින් එකක් තෝරාගෙන ඊට අදාළ ව වචන 250ට නොඅඩු රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) ජාතියක නවෝදයක් ඇති වන්නේ නව චින්තනයන් තුළිනි. අතීතයේ සිට මේ දක්වා අප පරිහරණය කරන සියලු මෙවලම් නව චින්තනයක ප්‍රතිඵලයකි. අප හමුවේ තව කොතෙකුත් අවශ්‍යතා ඇත. ඒ සඳහා අප සතුව පවත්නා ශක්තීන් හා තාක්ෂණය මෙහෙයවා නව පාසල් පසුබිමක් නිර්මාණය කිරීම යුගයේ අවශ්‍යතාවකි.

(ආ) පැරණි මිනිසා දස අත පැතුරුණු දැනුමෙන් හා තර්කානුකූල බුද්ධියෙන් යුක්ත වූ බවට බොහෝ සාධක ඇත. එක් සාධකයක් ලෙස ඔවුන් ව්‍යවහාර කළ භාෂාව ගත හැකි ය. මිනිස් හැසිරීම්, ගස්වැල්, ඉතිහාස පුවත් ආදිය මුල් කර ගනිමින් ගොඩනගා ගත් සාම්ප්‍රදායික යෙදුම්වලින් පෝෂිත එම බස ජීව ගුණයෙන් ඉහළ ය. අපට අනන්‍ය වූ එම යෙදුම් අද භාවිතයේ දක්නට ලැබෙන්නේ ඉතා අඩු වශයෙනි. එම යෙදුම්වල අගය වියැකී යාමට නොදී බසෙහි ජීව ගුණය සුරකිමු.

(ඉ) යහපත් සමාජයක් ගොඩනැගීමේ ලා මූලික වන්නේ මානව සම්බන්ධතාවයි. සංකීර්ණ සමාජයක ජීවත් වන අප සියලු කණ්ඩායම් සමග ක්‍රියා කළ යුතු අන්දම හඳුනාගත යුතු ය. හුදු ආත්මාර්ථයෙන් තොර ව පවුලක් වශයෙන් ද සමාජයක් වශයෙන් ද මිනිසා එකිනෙකා හා බැඳී සිටිය යුතු ය. මේ පිළිබඳ ව බහුතරයක් ජනතාව දැනුවත් වූ කල ආර්ථික, සාමාජික හා සංස්කෘතික වශයෙන් සංවර්ධිත සමාජයකට නව මං පෙත් පෑදෙනු ඇත.

(ඊ) සමාජයේ සිදු වන සියලු අපරාධවල මූලබීජ හට ගන්නේ මිනිස් සිත්වල ය. මිනිස් සිත සකස් කළ යුත්තේ කුඩා කල සිට ය. මේ සඳහා නිසි මග වන්නේ දහම් අධ්‍යාපනයයි. දහම් පාසල වෙත තව දුරටත් සිසුන් යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

(ලකුණු 25)

(03) පහත දැක්වෙන ඡේදය වචන 50-55 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන ගණන සාරාංශය අග යොදන්න.

සංස්කෘතිය තුළ දක්නට ලැබෙන තවත් විශේෂ ගුණාංගයක් වන්නේ එක් පරපුරකට පමණක් සීමා නොකොට එය පරපුරකින් පරපුරකට උරුම කරවිය හැකි වීම ය. මෙසේ එක් පරපුරකින් තවත් පරපුරක් කරා සංස්කෘතිය ළඟා වීමේ දී ඒ තුළට අලුත් අලුත් දේ එක් වෙයි. සංස්කෘතියෙහි විවිධ අංශ තුළට නව අංග එකතු වන්නේ විවිධ ආකාරවලට ය. කිසියම් සමාජයක විවිධ කාල පරිච්ඡේදවලට අවශ්‍ය හා අනුරූප වන පරිදි නව අංග එකතු වෙයි. නිදසුනක් හැටියට සිංහල භාෂාව සම්බන්ධයෙන් විවිධ කාල පරිච්ඡේදවල දී ඇති වූ වෙනස්කම් දැක්විය හැකි ය. පොළොන්නරු යුගය වන විට සංස්කෘත තද්භව ශබ්ද බෙහෙවින් පිවිසීමත්, ඊට බොහෝ කලකට පසුව පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි පාලන සමයයන් තුළ දී භාෂාව තුළට එකතු වූ වචන හා වාක්‍ය රටා ආදියත් නිදසුන් ලෙස දැක්විය හැකි ය. භාෂාව හැරුණු විට සෙසු සංස්කෘතික අංගයන් පිළිබඳව ද මෙම කරුණ සාධාරණ ය. පරපුරකින් පරපුරකට සංස්කෘතිය උරුම කරවන ක්‍රියාවලියේ දී කිසියම් සමාජයක දක්නට ලැබෙන හැසිරීම් රටාවල ඇති නිත්‍ය වූ ස්වභාවය කිසියම් සමාජයකට හෝ පුද්ගලයෙකුට සීමා නොවන ස්වාධීන බවක් උසුලයි.

(ලකුණු 10)

(04) පහත දැක්වෙන ඡේදය ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ආත්මාර්ථය-පරාර්ථ චර්යා වශයෙන් තමාටත් අනුන්ටත් වැඩදායී වන්නේ පුද්ගලයෙකුගේ පරිණත හෙවත් මුහුකුරා ගිය ස්වීයත්වය බව අධ්‍යාපන මනෝ විද්‍යාවේ විස්තර වෙයි. පොදු සමාජය දෙස බලන විට පරිණත ස්වීයත්වයක (මේරූ පෞරුෂයක්) ඇති තැනැත්තන් වෙත නායකත්වය, ජනප්‍රියත්වය හා සාර්ථකත්වය ද ළඟා වී ඇති බව පෙනී යයි. මිනිසාගෙන් තමාටත්, සමාජයටත් සිදු වන වැඩ-අවැඩ රැඳී ඇත්තේ පුද්ගලයා මෙහෙයවන ස්වීයත්වයේ පරිණත හා අපරිණත ස්වභාවය අනුව ය. ප්‍රදෘෂ්ටිය හා මහෙච්ඡාව පරිණත බවට පත් වූවකුගේ මූලික ලක්ෂණ ලෙස සැලකේ. තව දුරටත් පැහැදිලි කරතොත අනාගත බලාපොරොත්තු සහිත උසස් වීමේ ආශාව පිළිබිඹු වන ධෛර්යසම්පන්නතාව පිරිපුන් මිනිසෙකුට තිබිය යුතු බවයි. එහෙත් අනුන්ගේ අවස්ථාවන් අයිතිවාසිකම් පැහැරගැන්ම මින් අදහස් නොවේ. ආත්ම දමනය හා විමසිලිමත් බව තවත් ලක්ෂණයකි. ආත්ම දමනයක්, විමසිල්ලක් නැතිව සමාජයට බසින්නා තමන්ගේත්, සමාජයේත් ප්‍රගතිය නසාලමින් වල් වැදුණු 'කණ ගවයෙකු' සෙයින් ක්‍රියා කොට අවසානයේ පරාජිතයෙකු වීම නොවැළැක්විය හැකි ය.

(i) මුහුකුරා ගිය පෞරුෂයක් ඇත්තවුන් වෙත ගලා එන වරප්‍රසාද ලෙස ඡේදයේ දක්වා ඇත්තේ මොනවා ද?

..............................................................................................................................

(ii) මෙම ඡේදයෙහි කණ ගවයෙකුට උපමා කර ඇත්තේ කුමන ආකාරයට සමාජයට අවතීර්ණ වන්නන් ද?

..............................................................................................................................

(iii) මහෙච්ඡාව යනු උසස්වීමේ ආශාවෙන් අන් අයගේ අවස්ථා පැහැර ගැනීමයි. ඡේදයට අනුව මේ මතය සත්‍යයක් ද? ..............................................................................

(iv) පරිණත පුද්ගලයකු තුළ තිබිය යුතු අගය කළ හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

(v) අර්ථ ලියන්න.

(1) පරිණත - ..............................................................................

(2) ආත්ම දමනය - ..............................................................................

(ලකුණු 2×5 = 10)

(05) ඉතා මෑතක විවෘත කළ ගංගොඩවිල, යොවුන්ගම ප්‍රදේශයේ 'සිසිලස' ජල ව්‍යාපෘතිය මගින් ප්‍රදේශයේ බහුතරයකගේ ජල අවශ්‍යතා සපුරාලයි. ඒ සඳහා ජලය ලබා ගන්නා විශාල ළිඳ කැණීමට ඉඩමක් පරිත්‍යාග කර ඇත්තේ, අංක 30 යොවුන්ගම, ගංගොඩවිල ලිපිනයේ පදිංචි සිරිල් වික්‍රමාරච්චි නමැති දානපති ව්‍යාපාරිකයෙකි. 'සිසිලස' ජල ව්‍යාපෘතියේ ලේකම් ඔබ යැයි සිතා ප්‍රදේශය වෙනුවෙන් ඔහු කළ උදාර මෙහෙය අගය කොට ස්තුතිය පිරිනමන ලිපිය ලියන්න. වචන 125ක් සෑහේ.

නැතහොත්

වෙරළුපාගොඩ දාම්පේ ප්‍රදේශයේ පිහිටි ධර්මරාජ විද්‍යාලයේ පැවති ප්‍රථමාධාර පුහුණු කිරීම් කඳවුර පිළිබඳ ව පුවත්පත් වාර්තාවක් ලියන්න. දිනය, ස්ථානය, අරමුණු, පුහුණු වැඩසටහන් හා සහභාගී වූවන් ආදි කරුණු සැලකිල්ලට ගනිමින් පුවත්පත් වාර්තාවක් සකසන්න.

(ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

## වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2014
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: III | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "පව් නැතැයි කියාත් වර දුන මැනවැ"
(අ) ඉහත ප්‍රකාශයට අනුව අවසර ඉල්ලන්නේ කාගෙන් ද?
(ආ) අවසර ඉල්ලන්නේ කුමක් සඳහා ද?

(ii) "වැසි බිඳු ඇද වැටී කුර ගැටෙන හඬ  දිදී
මිදුලේ රළ බැඳෙයි පෙණ බුබුළු බිඳී  බිඳී
(අ) "බිඳී බිඳී" යන්නෙන් ප්‍රකාශ වන ශබ්දාලංකාරය නම් කරන්න.
(ආ) මෙම කවි පන්තියේ රචකයා හඳුන්වන අන්වර්ථ නාමය කුමක් ද?

(iii) "රිදී කඳකි නයි පැටියෙකි දෙරණ වට"
(අ) මෙම කවියේ ඊළඟ කවි පාදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි සඳහන් කාව්‍යාලංකාරය නම් කරන්න.

(iv) "මම ගිහිල්ලා කෙල්ලට අඬ ගහන්න ඕන"
(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?
(ආ) මෙහි 'කෙල්ල' යනුවෙන් සඳහන් තැන්තියගේ නම කුමක් ද?

(v) "ගෙදරක් කියලා එකක් තිබුණේ නෑ"
(අ) මෙසේ ගෙදරක් නොතිබුණේ කාහට ද?
(ආ) එහි කතුවරයා ලියූ වෙනත් ග්‍රන්ථයක් නම් කරන්න.

(vi) (අ) සද්ධර්මාලංකාරය ලියැවුණු යුගය කුමක් ද?
(ආ) මෙම ග්‍රන්ථයෙන් උපුටා ගත් පාඩමෙහි එන කථා නායකයා කළ පූජාව කුමක් ද?

(vii) "සබඳ ඊට ආලයක් නොකරව"
(අ) මෙහි "සබඳ" යනුවෙන් අමතන්නේ කාට ද?
(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය රචනා කළ කතුවරයා නම් කරන්න.

(viii) (අ) පන්සිය පනස් ජාතක පොත ලියැවුණු සමයේ රට පාලනය කළ රජතුමාගේ නම ලියන්න.
(ආ) "විසි වසක ශේෂ පත්‍රය" කාව්‍ය ග්‍රන්ථය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ix) (අ) "මගුල් ගීය" පද්‍ය පන්තියෙහි දක්වෙන රසවත් පානය දක්වෙන පද්‍ය පාදය ලියන්න.
(ආ) මෙහි දක්වෙන ආකාරයට ගම් දරුවන්හට වැඩ පවරනු ලබන්නේ කවුරුන් විසින් ද?

(x) "ඉත පුරුදු පෙර කල
දුන් තොප මෙසේ කී කල"
(අ) මෙම ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන් විසින් ද?
(ආ) මෙහි ඉතිරි පාද දෙක ලියන්න.

ලකුණු 2×10 = 20

(02) පහත දක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) ජීවකයන් හා යහළු ව උන් කෙරෙහි මහත් වූ පෙම් බැඳ **සොළොස් දහසක මසුරන් හා අසුන් යෙදූ රථ දසි ගව මහීෂාදි බොහෝ සම්පත් දී සතුමානයෙන් යවූ හ.**

(ii) නුවෙන් අප අයැති
පසු පෙය දෙන්ට මං නැති
ණය කවුරු දන් දෙති
සිලව් කොට ඒ යළි එකෙක් ඇති

(iii) වේසක් නොවී සමගි වැ සැප විඳ ඉ න්ට
දාසක් ආයු ඇත අප සඳ කිඳුර න්ට
දෝසක් නැති වැ අතරෙක විය මිය ය න්ට
මේසක් නොදුටු කලැ කියනෙමි කවුරු න්ට

(iv) "යම් කෙනෙක් පූර්ව ජන්මයෙහි තමන් විසින් කරන ලද්දා වූ **කුශලානුභාවයෙන් මහත් ධන රාශියක් ලද්දාහු වී නම් ඒ වස්තුව රජ දරුවන් තබා ආනුභාවසම්පන්න දේවතාවෝත් උදුරාගත, නසාගත නොහෙති**"

ලකුණු 05×04 = 20

- 03, 04 යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 125ක් පමණ සෑහේ.

(03) **සද්ධර්මරත්නාවලිය** රසාලිප්ත නිර්මාණයක් වීමට එහි අවස්ථාවෝචිත ව යොදා ගත්,
(අ) උපමාලංකාර සහ
(ආ) අනුප්‍රාස යෙදුම්
බෙහෙවින් ම හේතු විය. උදාහරණ දෙක බැගින් ගෙන මෙම කියමන සනාථ කරන්න. ලකුණු 15

**නැතහොත්,**

(අ) මිහිරි මතකයන් පිරුණු අතීතයක්
(ආ) වේදනාවෙන් පිරුණු වර්තමානයක්
යන එකිනෙකට වෙනස් වූ අවස්ථා දෙකක් මනා සේ ගළපමින් **"කිඳුරු වලප"** පැදිපෙළ නිර්මාණය වූ ආකාරය අපූරු ය. උදාහරණ දෙක බැගින් ගෙන මේ පිළිබඳ විමසීමක් කරන්න. ලකුණු 15

(04) රාසුල් ජූගේ
(අ) අහිංසකත්වයත්
(ආ) අවංකභාවයත්
බාබු සහීබ්ගේ පවා හදවත සසල කිරීමට සමත් විය. **පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා** කෙටි කතාවෙන් උදාහරණ දෙක බැගින් ගෙන ඉහත ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. ලකුණු 15

**නැතහොත්,**

**කිසා ගෝතමියක නොවේ** පද්‍ය පන්තියෙන්,
(අ) දිළිඳු බවින් අසරණ වූ සමාජයත්
(ආ) හරසුන් පුහු ආටෝපවලින් යුතු සමාජයත්
මනා ව විවරණය වන ආකාරය නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. ලකුණු 15

- 05, 06, 07 ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 100ක් පමණ සෑහේ.

(05) "ගමෙන් සිදාදියට පැමිණි පියසේනගේ බලාපොරොත්තු නොසිතූ විරූ ලෙස බොඳ වී ගිය අකාරය අතිශය ශෝචනීය වේ." පද්‍ය පන්තියෙන් උදාහරණ තුනක් සහිත ව පැහැදිලි කරන්න. ලකුණු 10

(06) "ශබ්දාලංකාර භාවිත කිරීම නිසා **මහාමායා දේවිය දුටු සිහිනය** පද්‍ය පන්තියෙහි තේමාව වඩාත් හොඳින් නිරූපණය වේ." උදාහරණ තුනක් ඇසුරින් විමසන්න. ලකුණු 10

(07) **වේදබ්භ ජාතකයෙහි** එන බෝසත් චරිතයෙන් දක්වෙන උතුම් මිනිස් ගුණාංග වර්තමාන සමාජයට ද ආදර්ශ සපයන ආකාරය උදාහරණ තුනක් සහිත ව පැහැදිලි කරන්න. ලකුණු 10